# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/AD/05/SDO/EB/2022 | ඔබේ අංකය / உமது இல / Your No: ........................................... | දිනය / திகதி / Date: 2022.03.09 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා පැවැත්වෙන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව පැවැත්විය යුතු පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022 අප්‍රේල් මස අඟදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. ඒ සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පලකර ඇති අතර, එහි පිටපතක් ඔබගේ කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීමට හා අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

- මේ වන විට සමෘද්ධි සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර හෝ පත්කර ඇති හා I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති නිලධාරින්ට මෙම විභාගයට පෙනී සිටීමේ හැකියාව ඇත.

03. ඔබ කාර්යාලයේ සේවය කරන මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබන නිලධාරීන්ට, මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර **<u>2022.03.31</u>** දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමටත්, එම අයදුම්පත්‍රය තැපෑලට යොමු කිරීමට පෙර දෙපාර්තමේන්තුවෙහි පාලන අංශයේ samurdhicadre@gmail.com යන විද්‍යුත් ලිපිනයටද යොමු කිරීමටත් අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබාදෙන මෙන් ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
03. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස./අ.ක.ස.